# ඉල ඇටය, ගැහැණිය සහ නුඹ!

පුරුෂයාගේ ඉල ඇටය සොරා ගෙන
ගැහැණිය උපන්නා යයි
දොස් නගන නපුරු පෙම්වත!
නුඹ ඇගේ ආත්මයම සොරා ගත් බැව්
නො පවසන්නේ මන්ද?

ඈ
ප්‍රේමයේ නාමයෙන්
බිම ලූ  කඳුළැල්
පුපුරුවා ලූ සුසුමන්
නුඹේ ආත්මය දිනෙක
දවා හළු කර දමනු ඇත
සත්‍යවාදී මිනිසුන් උපදිනුයේ කලකිනි

අල්තාරය පා මුල තැබූ සුරත
සත්‍යයේ පැන් පොදින් දෝවනය වනු මිසක
පාපයට ගැති ඇඟිලි තුඩු අගින්
අදමිටු පහසක අවාසනාවන්ත හෝරාව
ඈ ඉදිරියේම ප්‍රාතිහාර්යයක් සේ
ප්‍රාදූර්භූත කළේ මන්ද?
ගින්න නම් සියල්ල දවාලන්නේ ම ය.

ඝණ්ඨා නාදයෙන් සැනහී
පිරිත් පැන් ඉස ඉස
බෝ මළුයෙහි දැල් වූ පහන් වැටියෙන්
නැඟ ආයේ දයාව මුසු මඳනලමය
දෙව්මැඳුර අම්මා කෙනෙකු වී බලා ඉන්නීය
නුඹ ඈ රිදවමින් ඉඳින්නෙහි
සංසාරයක පව් කරපින්නා ගෙන යන්නට ය

ඈ කුස දරන්නී නුඹ වෙතින් ලද්දා වූ
උද්දාමයේ රුධිර කැටියයි
නුඹේ අහංකාරයයි
ඈ වලප්නා සිහිනයේ
ස්වර්ග රාජ්‍යයයි
නුඹෙන් දොස් ලබන්නී ද
ගර්භාවට බඳුන් වන්නී ද
ඇය යි

ධර්මය සදාකාලිකය
නො පිරිහෙන්නේම ය
එහි නො පිහිටන්නෝ පාපයට බර වූ
මිසදිටුවන් වෙත්.
ධර්මය යනු සත්‍යය ය
සත්‍යයෙහි පිහිටා සිටීම ය.

නුඹ ලෙයින් උපන්නා වූ ඈ
නුඹ වෙතින්ම ශාප ලද්දී ය
අපමණ වූ නින්දා, අවමන් විඳින්නී ය
උරතලාවෙහි එල්ලී කිරිසිනා වඩන්නට
අවසර නැති කල්හී
හඬා වැටෙන්නී ද නුඹ සනසන්නී ද
ඇය යි

නුඹේ සෙවණැල්ල නුඹ සොයන්නේ ද
නුඹට හමු වනුයේ ඇගේ සෙවණැල්ල ය
නුඹ ලෝකය දකින්නේ ද
ඇගේ දෙනෙතිනි
මල් පුබුදන්නී ද පිනි සදන්නී ද ඈ ය
නුඹේ තනිවට උපන්නී වුව ද
නුඹේ ඉල ඇටය සොරා ගත්තී ය
එ වරද ට
නුඹ
ඇගේ ආත්මය ම උදුරා ගත්තෙහි ය
සදාකාලික දඬුවම් දුන්නෙහි ය

දුෂ්ඨ පෙම්වත
ලෝකය ගොඩ නැඟූයේ ද
ආදරය දායාද කළේ ද ඇගේ හදවතින් ය
නුඹ උපන්නෙහි ද
කරුණාව වෑහෙන ඈ කුස පිහිටා ය
නුඹට ඉල ඇට පෙළක් දුන්නී ද
ඈ ය.

**තුෂාරි ප්‍රියංගිකා**



**Dexter Ranasinghe**
11yrs Epping








# A home loan specialist who speaks your language.



**Vajira Karunaratna**
Personal Lender

Home loans can seem confusing enough, without being in your second language. At the Commonwealth Bank we have lenders like Vajira, who speak Sinhalese as well as English. Vajira not only knows your language, he knows your area too. Extensive local lending experience means he's got a pretty good idea about what kind of home loan might suit you best. And you'll usually have a decision in 24 hours.

So call **Vajira** on **0401 593 567** to set up an appointment with someone you can truly talk to.

**commbank.com.au**

**Determined** to be different

**Important information:** Applications for finance are subject to the Bank's normal credit approval. Full terms and conditions will be included in the Bank's loan offer. Fees and charges are payable. Commonwealth Bank of Australia ABN 48 123 123 124. CBALA0605